දෙපාර්තමේන්තු චක්‍රලේඛ :- 10/2010

මගේ අංකය : ඩී10/ඇ.ස.,
බන්ධනාගාර මූලස්ථානය,
කොළඹ 09.
2010.02. 15

බන්ධනාගාර අධිකාරී,
වැලිකඩ ,කොළඹ රිමාන්ඩ් බන්ධනාගාරය,මැගසින්,
පර්යේෂන හා විශෝධන පුහුණු මධ්‍යස්ථානය,වැලිකඩ කාන්තා අංශය,
වැලිකඩ බන්ධනාගාර රෝහල.

**<u>පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර භාවිතා කිරීම</u>**

පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සළකුණු යන්ත්‍ර යොදා ගත යුතු බව 2009.04.16 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 09/2009 මගින් දන්වා ඇත.

02. එබැවින් මින් ඉදිරියට ඔබ ආයතනයේ සියළුම නිළධාරීන්ගේ පැමිණීමේ හා පිටවීමේ වේලාවන් සටහන් කිරීම සඳහා ආයතනය තුල ස්ථාපිත කර ඇති ඇඟිලි සළකුණු යන්ත්‍ර යොදා ගත යුතු බව දන්වමි.

03. යන්ත්‍රයේ නිවැරදි භාවය තහවුරු වන තෙක් ඇඟිලි සළකුණු යන්ත්‍රයේ යොදන වේලාවම යොදමින් දැනට පවත්වාගෙන යනු ලබන අත්සන් ලේඛණ ද ඇඟිලි සළකුණු යන්ත්‍රය භාවිතා කිරීම ඇරඹූ දින සිට මාස දෙකක් දක්වා ඇඟිලි සළකුණු යන්ත්‍රයට අමතරව යොදාගත යුතුය.

04. ඉහත පරිදි කටයුතු කර මාස තුනක් ඇතුලත එහි ප්‍රගතිය මා වෙත වාර්තා කරන්න.

වී.ආර්.සිල්වා ආර්එස්පී යූඑස්පී එන්ඩීයූ අයිජී
මේජර් ජෙනරාල් (විශ්‍රාමික)
බන්ධනාගාර කොමසාරිස් ජනරාල්.